## ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය - 2017

-----------------------------------------------------------------------

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1995 අංක 29 දරන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන පනතේ 19 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරිතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත වන බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

--------------------------------------------

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රමිතයේ 69 ඡේදයට අනුව ජංගම නොවන වත්කම් පාවිච්චිය සඳහා සූදානම් තත්ත්වයට පත්වූ දිනය පදනම් කරගෙන ක්ෂය කිරීම ආරම්භ කිරීම කලයුතු වුවත් ඊට පටහැනි ලෙස සමාලෝචිත වර්ෂය තුළ වැඩ නිමකර ආයතනය වෙත භාරදී තිබූ රු.168,255,533 ක් වටිනා ගොඩනැගිලි තුනක් සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ අවසාන ගෙවීම් සිදු කළ දිනය පදනම් කර ගෙන ක්ෂය ගණනය කර තිබීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය රු.2,298,707 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ) දේශීය අරමුදල් වැයකර මිලදීගෙන තිබූ එකතුව රු.639,266 ක් වටිනා වත්කම්, පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට පත්වූ අවස්ථාවේදී ජංගම නොවන වත්කම් ලෙස ප්‍රාග්ධනිත කිරීම වෙනුවට රඳවා ගැනීම් මුදල් ආපසු ගෙවා තිබූ අවස්ථාවේදී ප්‍රාග්ධනිත කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** 2012 වර්ෂයේදී මිලදී ගෙන තිබූ පිරිවැය රු.18,000,000 ක් වූ වාහන 02 ක පිරිවැය ඉක්මවා රු.340,603 ක් ක්ෂය කර තිබුණි.

**(ආ)** අයභාර වියදම් ලෙස ගිණුම්ගත කල යුතු වාහන අළුත්වැඩියාව සඳහා වැයකර තිබූ රු.335,545 ක් මෝටර් රථ පිරිවැය යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

**(ඇ)** දැයට කිරුළ වැඩසටහන යටතේ 2015 වර්ෂයේදී සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය වෙත ලබාදී තිබූ රු.මිලියන 46.1 ක් හා එම වැඩසටහන යටතේ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය වෙත ලබා දී තිබූ රු.මිලියන 9.4 ක් වැයකර අම්පාර උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ඉදිකර තිබූ දේශන ශාලාව සඳහා ආයතනය විසින් දරන ලද රු.මිලියන 9.4 ක වටිනාකම පමණක් ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණ ද අමාත්‍යාංශය විසින් වැය කරන ලද රු.මිලියන 46.1 ක වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) වර්ෂ ගණනාවක සිට ව්‍යාපෘති 05ක් මගින් පරිත්‍යාග ලෙස ආයතනයට ලබා දී තිබුණු වත්කම්වලට අදාළ ක්ෂය කිරීම් අවසන් වී තිබුණද එම පරිත්‍යාග වගකීම් වූ රු.983,193,091ක් මේ දක්වා ක්‍රමානුකූල පදනමක් යටතේ විලම්භිත ආදායම් ලෙස හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 ලැබිය යුතු ගිණුම්

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 සහ 2015 වර්ෂයන්හිදි අම්පාර සහ මට්ටක්කුලිය උසස් තාක්ෂණ ආයතනවලට ලබාදෙන ලද පිළිවෙළින් රු.333,697 ක් සහ රු.30,000 ක් වූ අත්තිකාරම් මුදල් ශේෂ මෙම වාර්තාවේ දින දක්වා නිරවුල් කරවාගෙන නොතිබුණි.

(ආ) ආයතනයේ සේවයෙන් ඉවත්ව ගිය නිලධාරීන් 09 දෙනෙකුගේ හිඟ ආපදා ණය ශේෂ, පෙර දැනුම් නොදී සේවයෙන් ඉවත්වීම හේතුවෙන් අයවිය යුතු ශේෂ, ගිවිසුම් කඩ කිරීම් හේතුවෙන් අයවිය යුතු ශේෂ හා භාර නොදුන් පොත් වෙනුවෙන් අයවිය යුතු ශේෂ යනාදී වශයෙන් ආයතනයට අයවිය යුතු රු.1,279,318 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

--------------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති සහ රෙගුලාසි යන ආදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1995 අංක 29 දරන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන පනතේ 21(ක) වගන්තිය | උසස් තාක්ෂණ ආයතනයට ලැබෙන ප්‍රදාන සහ ආයතනය විසින් උපයා ගනු ලබන යම් ආදායමක් බැර කළ යුතු අරමුදලක් පවත්වා ගැනීම සඳහා එක් එක් උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන වෙත පනතින් බලතල පැවරී තිබුණ ද අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2016 මාර්තු 03 දිනැති අංක SLIATE/CT/2016 දරන ලිපිය මගින් උසස් තාක්ෂණ ආයතනය මගින් උපයනු ලබන ආදායම් ප්‍රධාන කාර්යාලයේ ඉතිරිකිරීමේ ගිණුමෙහි තැන්පත් කළ යුතු බවට එම ආයතන වෙත දන්වා තිබුණි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ආයතනයේ භාවිතා කරන ලද වාහන සම්බන්ධයෙන් සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින් පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් සිදුකළ යුතු වුවද, එසේ සිදුකර නොතිබුණි. |
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය 2.1 වගන්තිය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගත යුතු වුවත් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතන ප්‍රධාන කාර්යාලය විසින් ස්ථාවර වත්කම් ලේඛනයන් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

**(ඇ)** 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

| | |
|---|---|
| 4.3.1 (අ) වගන්තිය සහ 4.3.2 වගන්තිය | ප්‍රසම්පාදන කොන්ත්‍රාත්තුව සඳහා වූ ආශ්‍රිත වියදම් ඇතුළුව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස්කර අදාළ අධිකාරී බලය යටතේ අනුමත කරවා ගත යුතු වුවද මට්ටක්කුලිය උසස් තාක්ෂණ ආයතනයේ නව නේවාසිකාගාරයට ගෘහ භාණ්ඩ හා උපකරණ මිලට ගැනීම සඳහා රු.17,552,220 ක් වූ ප්‍රසම්පාදන කොන්ත්‍රාත්තුවට අදාළව ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| 8.9.1 (අ) වගන්තිය | ලංසුකරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද ලංසුව ප්‍රතිග්‍රහණය කිරීමෙන් පසු විධිමත් ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත් කිරීමත් සමග භාණ්ඩ සැපයුම් කොන්ත්‍රාත්තුව සඳහා විධිමත් ගිවිසුමක් අත්සන් කළ යුතු වුවද පහත සඳහන් ප්‍රසම්පාදනයන් සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි.<br><br>**(i)** මට්ටක්කුලිය උසස් තාක්ෂණ ආයතනයේ නව නේවාසිකාගාරය සඳහා 2017 වර්ෂයේදී රු.11,265,670 ක් වටිනා කියවීමේ මේස සහ බන්කර් ඇඳන් සැපයීම.<br><br>**(ii)** 2017/2018 වර්ෂය සඳහා ප්‍රධාන කාර්යාලය සහ උසස් තාක්ෂණ ආයතනික අංශ 06 ක් සඳහා එකතුව රු.10,187,040 ක් වූ පවිත්‍රතා සේවා සැපයීමේ කොන්ත්‍රාත්තු 07 ක් පිරිනැමීම. |
| 8.12.3 (අ), (ආ) සහ (ඇ) වගන්ති | අනුමත සැලැස්ම අනුව භාණ්ඩ නිමකර ඇද්ද, කොන්ත්‍රාත්තු විධිවිධානයන්ට අනුකූල ද යන්න ස්ථානභාර නිලධාරී විසින් භාණ්ඩ පරීක්ෂා කර සහතික කළ යුතු වුවද මට්ටක්කුලිය උසස් තාක්ෂණ ආයතනයට අදාළව මිලට ගෙන තිබූ කියවීමේ මේස 181 ක්, බන්කර් ඇඳන් 183 ක් සහ කියවීමේ පුටු 378 ක් එවැනි සහතික කිරීමකින් තොරව භාර ගෙන තිබුණි. |
| 5.2.1(අ) වගන්තිය | ලංසු කැඳවීමේ ලේඛනවල ලංසුකරුවෙකුට අවශ්‍ය සියළු තොරතුරු ඇතුළත් කළ යුතු වුවද, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයේ ප්‍රධාන කාර්යාලය සහ ආයතනික අංශ 06 ක් සඳහා පවිත්‍රතා සේවා සපයා ගැනීමට අදාළ ලංසු කැඳවීම් ලියකියවිලිවල මසකට පවිත්‍රතා සේවාව සැපයිය යුතු නිශ්චිත දින ගණන සඳහන් කර නොතිබුණි. |
| 2.8.4 වගන්තිය | උසස් තාක්ෂණ ආයතනයේ ප්‍රධාන කාර්යාලය සහ ආයතනික අංශ 06 ක 2016/2017 වර්ෂය සඳහා පවිත්‍රතා සේවා සපයා ගැනීමට අදාළ ලංසු ඇගයීම, තාක්ෂණ ඇගයීම් කමිටුවක් මඟින් සිදුකර තිබුණ ද තාක්ෂණ ඇගයීම් කමිටුවක් පත් කිරීමට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.61,378,666 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.81,198,533 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.19,819,867 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. වර්ෂයේ මුළු ආදායම රු.103,824,727 කින් වැඩිවී තිබුණද පුද්ගල වැටුප් වියදම් රු.41,409,884 කින් සහ ගිවිසුම් ගත සේවා වියදම රු.34,355,724 කින් වැඩිවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේදී මූල්‍ය ඌනතාවයේ වැඩිවීමක් නිරීක්ෂණය වූ අතර 2015 වර්ෂයේදී මූල්‍ය අතිරික්තයක් ඇති වී තිබුණි. 2016 වර්ෂයේදී මූල්‍ය අතිරික්තයේ ක්‍රමික වර්ධනයක් සිදුවී තිබූ අතර නැවතත් සමාලෝචිත වර්ෂයේදී එම මූල්‍ය අතිරික්තයේ පිරිහීමක් නිරීක්ෂණය විය. එසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ක්ෂයවීම් නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේ රු.611,058,511 ක් වූ දායකත්වය 2017 වර්ෂය අවසාන වන විට රු.1,034,838,550 ක් දක්වා, එනම් සියයට 69 කින් වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

2013 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ පාඨමාලා සඳහා බඳවාගෙන තිබූ ශිෂ්‍ය සංඛ්‍යාව 8,264 ක් හෙවත් සියයට 159 ක වැඩිවීමක් නිරීක්ෂණය වූ අතර එසේම 2017 වර්ෂයේ දී බඳවා ගැනීමට සැලසුම් කළ ප්‍රමාණයට වඩා එම වර්ෂයේ තත්‍ය වශයෙන් බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව 5,336 ක් හෙවත් සියයට 66 ක වැඩිවීමක් නිරීක්ෂණය විය.

### 4.2 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

මට්ටක්කුලිය උසස් තාක්ෂණ ආයතනය වෙත 2011 වර්ෂයේදී ජෙම්කො (JEMCO) ව්‍යාපෘතිය මඟින් සිසුන්ගේ ප්‍රායෝගික පුහුණුව සඳහා වැඩපල (Work shop) වෙත ලබා දී තිබූ වැඩපල උපකරණ අයිතම 58 ක් වසර 05 කට වඩා වැඩි කාලයක් එම ආයතනයේ ගබඩාවක් තුළ කිසිදු පුහුණු කටයුත්තකට යොදා ගැනීමකින් තොරව රඳවාගෙන තිබුණි.

### 4.3 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම් හා දේපළවල ව්‍යාපෘති ආරම්භ කිරීම

යාපනය උසස් තාක්ෂණ ආයතනය වෙනුවෙන් සිව්මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ආයතනය විසින් 2016 ඔක්තෝබර් 12 වන දින රු.166,614,856 (බදු රහිත) වටිනාකමකට පෞද්ගලික ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සමාගමක් සමග කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව වෙනුවෙන් 2016 නොවැම්බර් 10 දින රු.36,988,498 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ලබා දීමෙන් අනතුරුව කොන්ත්‍රාත්කරු විසින් රු.19,389,905 ක නිම කරන ලද වැඩ සඳහා බිල්පත් ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද අදාළ ගොඩනැගිල්ල ඉදිකරනු ලබන ඉඩම වෙනත් පෞද්ගලික හිමිකරුවකුට අයත් බවට ඉඩමෙහි හිමිකමට අදාළ ලියවිලි ඉදිරිපත් කර පෞද්ගලික පාර්ශවයක් විසින් යාපනය දිස්ත්‍රික් උසාවියේ නඩුවක් පවරා තිබුණි.

**(ආ)** 2017 මාර්තු 09 දින සිට යාපනය දිස්ත්‍රික් උසාවියෙහි මේ සම්බන්ධයෙන් වූ නඩුව විභාග වෙමින් පැවති අතර අදාළ ඉඩමට ඇතුළුවීම උසාවිය විසින් තහනම් කර තිබීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දමා තිබූ අතර කොන්ත්‍රාත්කරු වෙත මේ වෙනුවෙන් ගෙවා ඇති මුදල නිශ්කාර්ය වියදමක් බව ද නිරීක්ෂණය විය.

**(ඇ)** ආයතනය විසින් ඉඩමේ අයිතිය නිරවුල් කර ගැනීමකින් තොරව ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම හේතුවෙන් මෙවැනි තත්ත්වයක් පැන නැගී තිබුණු අතර ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට නොහැකිවී තිබුණි.

### 4.4 මෙහෙයුම් ක්‍රියාකාරකම්

----------------------------

මට්ටක්කුලිය උසස් තාක්ෂණ ආයතනයට අන්තර්ජාල පහසුකම් සපයා ගැනීම සඳහා Lanka Education and Research Network (LEARN) ආයතනයේ සේවය ලබාගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** පර්යේෂණ කටයුතු හා අධ්‍යයන කටයුතු සිදුකිරීම අරමුණු කර ගනිමින් මෙම LEARN සම්බන්ධතාවය ලබාගෙන තිබුණ ද සිසුන්ට හා අධ්‍යයන කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ දේශනවලට අදාළ තොරතුරු ලබා ගැනීමට අන්තර්ජාලයට පිවිසීමේදී මෙම සම්බන්ධතාවයේ මන්දගාමී බව බාධාවක් වී තිබුණි. මේ හේතුවෙන් LEARN සම්බන්ධතාවයට අමතරව වෙනත් සම්බන්ධතාවයක් ලබාදෙන ලෙස අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් විසින් කර තිබූ ඉල්ලීම අනුව ආයතනයේ භාවිතා කරගෙන යනු ලැබූ දුරකතනයන් සම්බන්ධ කර ගනිමින් අමතර අන්තර්ජාල පහසුකම් ලබාගෙන තිබුණි.

**(ආ)** මෙසේ සමස්ත ආයතනයේම කටයුතු සඳහා භාවිතා කරන ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මඟින් ලබාගෙන ඇති දුරකථන සබඳතා 03 කට අදාළව දුරකථන වියදම් ද සහිතව අන්තර්ජාල සබඳතාව සඳහා මසකට වැයවන මුදල රු.60,000 කට ආසන්න මුදලක් වුවද LEARN සබඳතාවය වෙනුවෙන් 2017 වර්ෂය තුළ මසකට රු.121,760 ක් බැගින් ඉහත ආයතනය වෙත ගෙවා තිබුණි.

**(ඇ)** මෙම LEARN සම්බන්ධතාවය සඳහා 2015 අප්‍රේල් සිට 2017 දෙසැම්බර් දක්වා රු.3,962,988 ක් ගෙවා තිබියදී LEARN සම්බන්ධතාවය මන්දගාමී තත්ත්වයක් හේතුවෙන් අමතර මුදලක් වැයකර ටෙලිකොම් ආයතනයේ අන්තර්ජාල පහසුකම් ලබාගෙන තිබුණි.

## 4.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016/2017 වර්ෂයේ දෙහිවල හා මට්ටක්කුලිය උසස් තාක්ෂණ ආයතනවල පවිත්‍රතා සේවා සපයා ගැනීම් වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවිය යුතු එකතුව රු.3,016,408 ක් සඳහා ආයතනය විසින් ලියන ලද චෙක්පත් 07 ක් කිසිදු බලය පැවරීමේ ලියවිල්ලක් නොමැතිව ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලබාගෙන තිබුණි.

(ආ) උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය හා ආයතනික අංශ 06 ක් වෙනුවෙන් පවිත්‍රතා සේවා සපයා තිබූ ආයතනය නමින් වෙනත් පවිත්‍රතා සේවා ආයතනයක් ව්‍යාජ ලෙස ලියාපදිංචි කර, එසේ ව්‍යාජ ලෙස ලියාපදිංචි කරන ලද ව්‍යාපාර නාමය යටතේ රජයේ බැංකු ශාඛාවක ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කර තිබුණි. එසේ විවෘත කර තිබූ ඉතුරුම් ගිණුමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලබාගෙන තිබූ චෙක්පත් තැන්පත් කර තිබුණි.

(ඇ) දෙහිවල උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ 2017/2018 වර්ෂයට අදාලව පවිත්‍රතා කටයුතු සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේ සේවා සැපයූ ආයතනයම සුදුසුකම් ලබා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් සිදුකල විගණනයේදී එම සමාගම විසින් ආයතනය වෙත ඉදිරිපත් කර තිබුණු ව්‍යාපාර ලියාපදිංචි සහතිකය හා සේවක අර්ථ සාධක අරමුදල් වලට අදාල සහතික ව්‍යාජ ලියවිලි බව සනාථ විය.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 758 ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 627 ක් වූයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 131 ක් විය. ඒ තුළ ජ්‍යෙෂ්ඨ, තෘතියික සහ අධ්‍යයන මට්ටමේ තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව පිළිවෙළින් 10 ක්, 43 ක් සහා 29 ක් විය.

(ආ) ජ්‍යෙෂ්ඨ මට්ටමට අදාළව පවතින පුරප්පාඩු අතුරින් අධ්‍යක්ෂ, ගණකාධිකාරි, අභ්‍යන්තර විගණක යන තනතුරු පුරප්පාඩු වී පැවතුන ද සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයතනයේ මූල්‍ය, පරිපාලනමය හා අධ්‍යයන කටයුතුවලට අදාළ කාර්යයන් අදාළ අරමුණු හා ඉලක්ක කරා මෙහෙයවීමේදී මෙම ජ්‍යෙෂ්ඨ, තෘතියික සහ අධ්‍යයන මට්ටමේ තනතුරුවල දායකත්වය ඉතා වැදගත් වුවද ඊට අදාළ තනතුරු පුරප්පාඩු පිරවීමට අදාළ ක්‍රියාමාර්ග ගෙන නොමැති බව ඉහත තනතුරු පුරප්පාඩු අනුව නිරීක්ෂණය විය.

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. එසේ වුවද හඳුනාගෙන තිබූ එහි විෂය පථයට ගැනෙන අරමුණුවල කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසාර සංවර්ධන ඉලක්කයන් වෙත ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහි කර ගැනීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 6.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එලෙස අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ)** ආයතනයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු පැවතුනද එම අඩුපාඩු අනාවරණය කර ගැනීම සඳහා ආයතනයේ අභ්‍යන්තර විගණන අංශය විසින් ප්‍රමාණවත් විගණනයක් සිදු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

### 6.2 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 6.2.1 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගාල්ල උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ වැඩපල (Work shop) සඳහා පරීක්ෂණාගාර උපකරණ සවිකිරීම සඳහා වූ වටිනාකම රු.49,024,612 ක් වූ ප්‍රසම්පාදනය වෙනුවෙන් සැපයුම්කරු සමග 2017 දෙසැම්බර් 18 දින ගිවිසුමකට එළඹ තිබූ අතර ගිවිසුම් ප්‍රකාරව 2018 පෙබරවාරි 15 දිනට ප්‍රථම අදාළ උපකරණ සපයා සවිකිරීම් නිමකළ යුතු විය. එසේ වුවද මෙම වාර්තාවේ දින වන විටත් අදාළ සවිකිරීම් කටයුතු නිමකර නොතිබුණි.

(ආ) එසේම මෙම ප්‍රසම්පාදනය වෙනුවෙන් රු.9,804,922 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණු අතර අත්තිකාරම් බැඳුම්කරයේ කාලය 2018 ජනවාරි 31 දිනෙන් අවසන්ව තිබුණි. නමුත් බිල්පත් මඟින් එම මුදල ආවරණය කර ගැනීමට හෝ බැඳුම්කර කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ)** මට්ටක්කුලිය උසස් තාක්ෂණික අධ්‍යාපනික ආයතන භූමියෙහි රැස්වන වැසි ජලය බැසයාම සඳහා පූතික ටැංකිය **(Septic Tank)** ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් රු.3,800,500 ක වටිනාකමකට 2017 ජූලි 14 දින කොන්ත්‍රාත්කරු සමග ගිවිසුමකට එළඹ තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(i)** ලංසු කැඳවීම 2016 දෙසැම්බර් 02 දින සිදුකර තිබුණද ලංසු ප්‍රදානය සහ කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කිරීම මාස 07 කට ආසන්න කාලයක් ප්‍රමාද වී තිබුණි.

**(ii)** ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවට අදාළ රු.3,821,000 ක් වටිනා ඇස්තමේන්තුවක් පිළියෙළ කර තිබූ නමුත් එයට අදාළ ප්‍රමාණ පත්‍ර පිළියෙළ කර නොතිබීම හේතුවෙන් ඉදිකිරීම්වලට අදාළ කාර්යයන් නිමකළ යුතු ආකාරය සහ ඇස්තමේන්තු මිල ගණන් තීරණය කර තිබූ ආකාරය පිළිබඳ විගණන කටයුතු සිදු කිරීම ගැටළුකාරී විය.

(ඇ) මට්ටක්කුලිය උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ නව නේවාසිකාගාරය සඳහා අවශ්‍ය වානේ අල්මාරි 190, කියවීමේ මේස 190, කියවීමේ පුටු 380 ක්, බංකර් ඇඳන් 190 ක් හා මෙට්ට 380 ක් මිලට ගැනීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) බන්කර් ඇඳන් සැපයුම්කරු විසින් එක් ඇඳක් රු.35,493 ක් වූ මිලකට රු.6,388,740 ක් වටිනා ඇඳන් 180 ක් 2018 ජනවාරි 10 දින සපයා තිබුණු අතර ඒවා සාම්පල්වලට හා සැලැස්මට අනුව නිසි ප්‍රමිතියෙන් නිමකර නොතිබුණු බව 2018 මාර්තු 20 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ii) බන්කර් ඇඳන්වල සැලසුමට අනුව ඉහළ ඇඳේ කොටස් SCH 40,1.00 DIA ප්‍රමාණයේ බට යොදා නිම කළ යුතුව තිබුණද එම අයිතමයන් සියල්ල L Angle යොදා නිමකර තිබුණි. එසේම එම ඇඳන්වල ඉහළ ඇඳේ වම් හා දකුණු පස ආරක්ෂිත වැට (Hand rest) ඇඳේ දිග ප්‍රමාණයෙන් 2/3 ක ප්‍රමාණයක් ආවරණය වන පරිදි නිමකළ යුතු වුවද බට වෙනුවෙන් Flat iron යොදා ඇඳේ දිග ප්‍රමාණයෙන් 1/3 ක් පමණක් ආවරණය වන පරිදි ආරක්ෂිත වැට නිමකර තිබුණි. මේ හේතුවෙන් බන්කර් ඇඳන්වල ආරක්ෂිත වැටේ ශක්තිමත්භාවය අඩුවී තිබූ අතර ඇඳන්වල කැපෙන සුලු/ඇනෙන සුලු තත්ත්වයක් නිරීක්ෂණය විය. එවැනි අවස්ථාවල සිසුන් විසින් රෙදි කැබලි ඔතා ආරක්ෂාව සලසාගෙන තිබූ අතර මේ අනුව ඉදිරිපත් කර තිබූ සාම්පලවලට සම්පූර්ණයෙන් වෙනස් වූ ඇඳන් සපයා තිබූ බව නිරීක්ෂණය විය.

(iii) එසේම සැලැස්මට අනුව ඉහළ සහ පහළ ඇඳන්වලට අඟල් 74x38 x0.5 ප්‍රමාණයේ සම්පූර්ණ Plywood Sheet යෙදිය යුතු වුවද එක් ඇඳකට කැබලි 03 ක් හෝ 04 ක් වන පරිදි Plywood Sheet කැබලි යොදා තිබූ අවස්ථා නිරීක්ෂණය විය. භාණ්ඩ භාරගත් බවට වූ ලියවිලි අනුව ප්‍රසම්පාදනය කර තිබූ ඇඳන් 183 ට අයත් වූ ඉහළ හා පහළ ඇඳන් 366 න් 152 ක්ම ලෑලි කොටස් යෙදූ ඇඳන් බව එම ලියවිලි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(iv) කියවීමේ මේස සැපයුම්කරු විසින් 2018 ජනවාරි 10 දින එකක් රු.23,800 බැගින් රු.4,307,800 ක් වටිනා කියවීමේ මේස 181 ක් සපයා තිබූ අතර කියවීම් මේසයේ ලෑල්ල සහ මේසයට සම්බන්ධ ෆයිල් රාක්ක සියල්ල අඟල් 0.75 ක ඝණකමකින් යුක්තව මහෝගනී ලෑල්ලෙන් නිමවිය යුතු බවට පිරිවිතර අනුමත කර තිබුණද එම අයිතම සියල්ල Plywood Sheet වලින් නිමකර තිබුණි. තවද සවිකර තිබුණු ෆයිල් රාක්කවල කොටස් ගුල්ලන් විදීම නිසා කුඩු මතු වී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(v) කියවීමේ පුටු සැපයුම්කරු විසින් 2018 ජනවාරි 10 දින එකක් රු.5,000 බැගින් රු.1,890,000 ක් වටිනා කියවීම් පුටු 378 ක් සපයා තිබුණු නමුත් ප්‍රසම්පාදනය කර තිබූ පුටු, අනුමත පිරිවිතර අනුව නිමවිය යුතු හැඩයෙන් හා ශක්තිමත් වන පරිදි නිම නොකිරීම නිසා පුටුවේ ඉඳගෙන අධ්‍යයන කටයුතු කිරීමේදී යම් කායික අපහසුවක් ඇති වන බවද සිසුන් විසින් කරන ලද කරුණු පැහැදිලි කිරීමේදී අනාවරණය විය.

**7. පද්ධති හා පාලනයන්**

---------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව වත්කම් හඳුනා ගැනීම සහ ක්ෂය ගණනය කිරීම් කර නොතිබීම. |
| (ආ) | මූල්‍ය පාලනය | ආයතනයේ නිලධාරීන්ගෙන් ආයතනයට අයවිය යුතු හිඟ ශේෂ ප්‍රමාදයකින් තොරව අයකර නොගැනීම. |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය | විධිමත් පරිදි කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹ නොතිබීම, ගිවිසුම්ගත කොන්ත්‍රාත් සම්බන්ධයෙන් ඊට අනුකූලව කටයුතු නොකිරීම, කොන්ත්‍රාත්තු ප්‍රමාදයන් අවම කිරීම සහ ප්‍රමාදයන් සම්බන්ධ ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම. |
| (ඈ) | ප්‍රසම්පාදන පාලනය | **(i)** ලංසු කැඳවීම, විවෘත කිරීම, ලංසු ඇගයීම සහ ප්‍රසම්පාදන තීරණ මත ලංසු ප්‍රදානය කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු නොකිරීම.<br><br>**(ii)** ලංසු ඇගයීමේ දී අදාළ ලංසු ලියවිලිවල නිවැරදිතාවය සම්බන්ධයෙන් කමිටුව විසින් සැලකිල්ලට භාජනය නොකිරීම.<br><br>**(iii)** ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මූලික අරමුණු වන උසස් ගුණාත්මකභාවයක් සහිත අවම පිරිවැයක් දැරීමේ ප්‍රතිඵලයක් ලෙස උපරිම ආර්ථික වාසි සලසාගැනීම, නිසිකලට වේලාවට ගුණාත්මකභාවයෙන් යුතු ප්‍රසම්පාදන කටයුතු කිරීම, නිශ්චිත ප්‍රමිතීන්වලට පිරිවිතරවලට, නීතිරීතිවලට, රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම, ඇගයීම් හා තේරීමේ කාර්යය පරිපාටියේ විනිවිදභාවයකින් හා නීත්‍යානුකූලභාවය සහතිකකිරීම සිදු කර නොතිබීම. |
| (ඉ) | ගෙවීම් කිරීම | අදාළ මුදල් රෙගුලාසිවලට අනුකූලව වවුචරයේ නම සඳහන් තැනැත්තාගේ හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාට පමණක් ගෙවීම් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබීම. |